# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 70 දරන
# ත්‍රස්තවාදය මර්දනය කිරීම සඳහා වූ "සාක්" කලාපීය සම්මුති පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක.

මිල: ශත 60 යි. තැපැල් ගාස්තුව: ශත 75 යි.

## 1988 අංක 70 දරන ත්‍රස්තවාදය මර්දනය කිරීම සඳහා වූ "සාක්" කලාපීය සම්මුති පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 3/88

**කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියා සංගමයේ ත්‍රස්තවාදය මර්දනය කිරීම සඳහා වූ කලාපීය සම්මුතිය බලාත්මක කිරීමට විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

එක්දහස් නවසිය අසූහතේ නොවැම්බර් මස හතරවන දින කත්මණ්ඩු නගරයේ දී ශ්‍රී ලංකා ආණ්ඩුව සහ කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියා සංගමයේ සාමාජික රාජ්‍යයන් වෙනුවෙන්, ත්‍රස්තවාදය මර්දනය කිරීම සඳහා වූ කලාපීය සම්මුතියක් අත්සන් කරන ලද හෙයින් සහ 1988 අගෝස්තු මස 22 වන දින ඉහත කී සම්මුතියේ විධිවිධානවලට අනුකූලව ස්ථිර කිරීමේ සාධන පත්‍ර තැන්පත් කළ විට එම සම්මුතිය ක්‍රියාත්මක වූ හෙයින් ද :

ඉහත කී සම්මුතියේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා නීතිමය විධිවිධාන සැලැස්වීම අවශ්‍යව ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1988 අංක 70 දරන ත්‍රස්තවාදය මර්දනය කිරීම සඳහා වූ "සාක්" කලාපීය සම්මුති පනත යනුවෙන් සඳහන් කරනු ලැබේ.

### I වන කොටස

### ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතට කරනු ලබන සංශෝධන

උදර්පන පනතේ උපලේඛනයට කරනු ලබන සංශෝධන.

2. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ උපලේඛනය, එහි අගට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

'ආ' කොටස

(අ) 1970 දෙසැම්බර් මස 16 වන දින හේග්හි දී අත්සන් කරන ලද නීති විරෝධී ලෙස ගුවන් යානා අල්ලා ගැනීම මර්දනය කිරීම පිළිබඳ සම්මුතියේ විෂය පථය ඇතුළත වූ වරදක් ;

(ආ) 1971 සැප්තැම්බර් මස 23 වන දින මොන්ට්‍රියෙල්හි දී අත්සන් කරන ලද සිවිල් ගුවන්ගමන්වල ආරක්ෂාවට එරෙහිව වූ නීති විරෝධී ක්‍රියා මර්දනය සඳහා වූ සම්මුතියේ විෂය පථය ඇතුළත වූ වරදක් ;

(ඇ) 1973 දෙසැම්බර් මස 14 වන දින නිව්යෝර්ක්හි දී අත්සන් කරන ලද රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන් ඇතුළුව අන්තර් ජාතික වශයෙන් ආරක්ෂිත තැනැත්තන්ට විරුද්ධව වූ අපරාධ වැළැක්වීම හා ඒවාට දඬුවම් කිරීම පිළිබඳ සම්මුතියේ විෂය පථය ඇතුළත වූ වරදක් ;

(ඈ) 'සාක්' සාමාජික රාජ්‍යයන් පාර්ශ්වකරුවන් වූ ද නඩු පැවරීමට හෝ උදර්පනය ලබා දීමට පාර්ශ්වකරුවන්ට බැඳීමක් ඇති කෙරෙන්නා වූ ද යම් සම්මුතියක විෂය පථය ඇතුළත වූ වරදක් ;

(ඉ) මිනීමැරීම, මිනීමැරීම නොවන සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය, ශාරීරික හානි සිදුවන පහරදීම, පැහැරගෙනයාම, ප්‍රාණ ඇපකරුවන් වශයෙන් ගැනීම සහ තැනැත්තන්ට මරණය හෝ බරපතල ශාරීරික තුවාල හෝ දේපළවලට බරපතල හානි සිදුවන හිතුවක්කාර හිංසාකාරී ක්‍රියා ඇති කිරීමේ මාර්ගයක් වශයෙන් භාවිත කළ විට ගිනි අවි, ආයුධ, පුපුරණ ද්‍රව්‍ය සහ අන්තරායදායක ද්‍රව්‍යවලට අදාළ වැරදි.

**අර්ථ නිරූපණය.**

3. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කුමක් සඳහන්ව ඇත ද ඒ පනතේ උපලේඛනයේ 'ආ' කොටසේ, සහ මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් වරදක්, ඒ යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ හෝ වරදකරු කරනු ලැබූ තැනැත්තකු උදර්පනය කිරීමේ කාර්යය සඳහා පමණක්, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් රාජ්‍යයක් අතර වන තාක් දුරට දේශපාලන ස්වරූපයක වූ වරදක් ලෙස හෝ, දේශපාලන වරදකට සම්බන්ධ වරදක් ලෙස හෝ දේශපාලන අරමුණු මුල් කරගත් වරදක් ලෙස හෝ එම ජාතික රාජ්‍ය සභා පනතේ කාර්ය සඳහා සලකනු නොලැබිය යුතු ය.

## II වන කොටස

## උදර්පන වැඩපිළිවෙළවල් පිළිබඳ විධිවිධාන

**ඇතැම් සාක් රාජ්‍යයන් සමග දැනට ඇති උදර්පන වැඩ පිළිවෙළවල් වලින් උපලේඛනයේ ඇති වැරදි සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වෙන බව.**

4. මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් රාජ්‍යයක් සමග ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඇති කරගත් උදර්පන වැඩ පිළිවෙළක්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී බලාත්මකව පවතින අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කාර්ය සඳහා, එම වැඩපිළිවෙළට මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් වැරදි සම්බන්ධයෙන් උදර්පනය සඳහා වූ විධිවිධාන ඇතුළත් ලෙස සලකනු ලැබිය යුතු ය.

5. මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් රාජ්‍යයක් සමග ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඇති කරගත් උද්ර්පන වැඩ පිළිවෙලක්, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේදී, බලාත්මකව නොපවතින අවස්ථාවක ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ර්පන පනතේ කාර්ය සඳහා, සම්මුතිය, මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් වැරදි සම්බන්ධයෙන් උද්ර්පනය සඳහා විධිවිධාන සලස්වමින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් එම රාජ්‍යය සමග ඇති කරගත් උද්ර්පන වැඩ පිළිවෙලක් වශයෙන් සලකනු ලැබිය හැකි ය.

*උපලේඛනයේ සඳහන් වැරදි සම්බන්ධයෙන් වන විට, සම්මුතිය, ශ්‍රී ලංකාව සහ ඇතැම් 'සාක්' රාජ්‍ය අතර උද්ර්පන වැඩ පිළිවෙලක් වශයෙන් අමාත්‍යවරයා විසින් සලකනු ලැබිය හැකි බව.*

6. (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ වරදකරු කරනු ලැබ සිටින යම් තැනැත්තකු උද්ර්පනය කිරීම සඳහා මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ඉල්ලීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයා විසින්, එම වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට නඩු පැවරීම හෝ ඒ තැනැත්තා උද්ර්පනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගෙන ඇති හෝ ගැනීමට යෝජිත පියවර ගැන ඉල්ලුම්කාර රාජ්‍යයේ ආණ්ඩුවට නොපමාව දැන්විය යුතු ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලබා ඇති හෝ වරදකරු කරනු ලැබ ඇති තැනැත්තකු උද්ර්පනය කිරීම සඳහා ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ර්පන පනත යටතේ උද්ර්පනය කිරීම සඳහා මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් රාජ්‍යයක ආණ්ඩුව විසින් කරන ලද ඉල්ලීමක් අනුව එම තැනැත්තා උද්ර්පනය කිරීම සඳහා එම ජාතික රාජ්‍ය සභාවේ පනත යටතේ නියමයක් නොකළ යුතු බව තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක, එම තැනැත්තා චෝදනා ලැබ ඇති වරද සම්බන්ධයෙන් නඩු පැවරීම හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීම ගැන සලකා බැලීම සඳහා එම කාරණය අදාළ බලධාරීන්ට ඉදිරිපත් කළ යුතු ය.

*උද්ර්පන ඉල්ලීමකට විෂය වන තැනැත්තන්ට විරුද්ධව ගන්නා පියවර, ඉල්ලුම්කාර රටට දැන්වීම අමාත්‍යවරයාගේ කාර්යය වන බව.*

## III වන කොටස

### අපරාධ නඩු කටයුතුවල කාර්ය සඳහා අධිකරණ බලය

7. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වුවද නොවුවද, යම් තැනැත්තකු, ශ්‍රී ලංකාවේ දී සිදු කරන ලද්දේ නම් මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් වරදක් වන යම් ක්‍රියාවක් සම්මුති රටක දී සිදු කරන්නේ නම්, එම ක්‍රියාව ශ්‍රී ලංකාවේ දී සිදු කිරීමෙන් සංයුක්ත වන්නා වූ වරදට එම තැනැත්තා, ශ්‍රී ලංකාවේ දී වරදකරු විය යුතු ය.

*අධිකරණ බලය.*

**ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් වූ අධිකරණ බලය.**

8. (1) සම්මුති රටක ජාතිකයකු වන නමුත් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු විසින් යම් සම්මුති රටක දී ඔහු වරදකට වරදකරු වන්නා වූ ද ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූයේ නම් මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් වරදකට වරදකරු විය හැකි යම් ක්‍රියාවක් ශ්‍රී ලංකාවෙන් සහ එම සම්මුති රටෙන් පිටත දී සිදු කළහොත්, ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූයේ නම් ඔහු වරදකරු වන එම ක්‍රියාව පිළිබඳව වූ වරදට ඔහු වරදකරු විය යුතුය.

(2) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත දි හෝ සම්මුතියට අයත් යම් රටකින් පිටත යම් ක්‍රියාවක් සිදු කරනු ලැබුවහොත්, ඒ ක්‍රියාව ශ්‍රී ලංකාවේ දී සිදු කරන ලද්දක් නම් ඒ තැනැත්තා මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් වරදක් සම්බන්ධයෙන් වරදකරු විය හැකිව තිබුණේ නම්, එසේ ශ්‍රී ලංකාවේ දී සිදු කරනු ලැබූ විට ඔහු වරදකරු විය හැකිව තිබුණු ඒ ක්‍රියාව හේතු කොට එකී වරද සම්බන්ධයෙන් ඔහු වරදකරුවෙක් වන්නේ ය.

මේ වගන්තියෙහි "සම්මුති රට" යන්නෙන් මේ පනතේ දෙවන උපලේඛනයේ සඳහන් යම් රටක් අදහස් වේ.

**මහාධිකරණයේ අධිකරණ බලය.**

9. (1) 7 වන සහ 8 වන වගන්තිවල සඳහන් වැරදි පිළිබඳ නඩු විභාග කිරීමට ශ්‍රී ලංකාවේ මහාධිකරණයට මෙයින් අධිකරණ බලය පවරනු ලැබේ.

(2) (1) වන උපවගන්තියෙන් මහාධිකරණයට පැවරුණු අධිකරණ බලය කොළඹ දී පවත්වන ශ්‍රී ලංකා මහාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

### පළමුවන උපලේඛනය

(4 වන සහ 5 වන වගන්ති)

**සම්මුතියේ 1 වන ව්‍යවස්ථාවේ සඳහන් වැරදි ලැයිස්තුව**

(අ) 1970 දෙසැම්බර් මස 16 වන දින හේග් හි දී අත්සන් කරන ලද නීති විරෝධී ලෙස ගුවන් යානා අල්ලා ගැනීම මර්දනය කිරීම පිළිබඳ සම්මුතියේ විෂය පථය ඇතුළත වූ වරදක් ;

(ආ) 1971 සැප්තැම්බර් මස 23 වන දින මොන්ට්‍රියල් හි දී, අත්සන් කරන ලද සිවිල් ගුවන් ගමන්වල ආරක්ෂාවට එරෙහි වූ නීති විරෝධී ක්‍රියා මර්දනය කිරීම සඳහා වූ සම්මුතියේ විෂය පථය ඇතුළත වූ වරදක් ;

(ඇ) 1973 දෙසැම්බර් මස 14 වන දින නිව්යෝර්ක් හි දී අත්සන් කරන ලද, රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන් ඇතුළු අන්තර් ජාතික වශයෙන් ආරක්ෂිත තැනැත්තන්ට විරුද්ධව වූ අපරාධ වැළැක්වීමේ සහ ඒවාට දඬුවම් කිරීම පිළිබඳ සම්මුතියේ විෂය පථය ඇතුළත වූ වරදක් ;

(ඈ) "සාක්" සාමාජික රාජ්‍යයන් පාර්ශ්වකරුවන් වූ ද, නඩු පැවරීමට හෝ උදර්පනය ලබාදීමට පාර්ශ්වකරුවන්ට බැඳීමක් ඇති කරන්නා වූ ද යම් සම්මුතියක විෂය පථය ඇතුළත වූ වරදක් ;

(ඉ) මිනීමැරීම, මනුෂ්‍යඝාතනය, ශාරීරික හානි සිදුවන පහරදීම, පැහැරගෙන යාම, ප්‍රාණ ඇපකරුවන් වශයෙන් ගැනීම සහ තැනැත්තන්ට මරණය හෝ බරපතල ශාරීරික තුවාල හෝ දේපළවලට බරපතල හානි සිදුවන හිතුවක්කාර හිංසාකාරී ක්‍රියා ඇති කිරීමේ මාර්ගයක් වශයෙන් භාවිත කළ විට ගිනිඅවි, ආයුධ පුපුරණ ද්‍රව්‍ය සහ අන්තරායදායක ද්‍රව්‍යවලට අදාළ වැරදි ;

**(ඊ) (අ) සිට (ඉ) දක්වා වූ ඡේදවල විස්තර කර ඇති වරදක් කිරීමට තැත්** කිරීම හෝ කුමන්ත්‍රණය කිරීම, එවැනි වරදක් සිදු කිරීමට ආධාර දීම, අනුබලදීම හෝ උපදෙස් දීම හෝ එසේ විස්තර කරනු ලැබ ඇති වරදකට සහායකයකු වශයෙන් හවුල් වීම.

දෙවන උපලේඛනය (6 වන වගන්තිය)

**කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියා සංගමයේ සාමාජික රාජ්‍ය**

**බංගලාදේශ මහජන ජනරජය**

**භූටාන් රාජ්‍යය.**

**ඉන්දියා ජනරජය**

මාලදිවයින් ජනරජය

නේපාල රාජ්‍යය.

**පාකිස්තාන් ඉස්ලාම් ජනරජය**

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයක දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ලබාගත හැකිය.